පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යාවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව අංක 290
ආයතනයේ නම :- ගුදම් පහසුකම්,බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

	කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා	දුර්වලතා මහ හරවා ගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
01	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිලිබඳ වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු සහ නිර්දේශ නියමිත කාලයේ දී ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයේ රාජ්‍ය අමාත්‍යාංශයේ පැවැති මානව සම්පත් හිඟය නිසාවෙන් වන අතර නියමිත කාලයෙන් පසුව බොහොමයක් ක්‍රියාත්මක කරන ලදී
02	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. වහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිලිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	මානව සම්පත් හිඟය නිසා ඉන්ධන දහන පරීක්ෂණයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර කෙසේ වුවද විගණන නිර්දේශවලින් පසු අදාළ පරීක්ෂණ සිදුකිරීමට කටයුතු යොදමින් පැවැති අවදියේදී රාජ්‍ය අමාත්‍යාංශය වසා දැමීමට කටයුතු කෙරිණි.

03	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	හිඟ ශේෂ පියවා ඉතිරි ණය ශේෂ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයට පැවරීමට කටයුතු කරන ලදී.
04	තොරතුරු දැන ගැනීමේ පනතට අනුව තම ආයතනයේ තොරතුරු ලබාදීම සඳහා නිශ්චිත නිලධාරියෙකු පත් කර නොතිබුණි. මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම /ලබා නොදීම සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	පැවති මානව සම්පත් හිඟය හේතු කොටගෙන යි නිශ්චිත තොරතුරු නිලධාරියකු පත්කර නොතිබුණු අතර එම කටයුතු ආවරණය කරනු ලැබුයේ වැඩ බලන අධ්‍යක්ෂක (සැලසුම්) විසිනි. සඳහා නියමිත ලේඛන පවත්වා ගත් අතර රාජ්‍ය අමාත්‍යාංශය වෙත මහජනයා සමග නොගැටෙන කාර්යන් පැවරී තිබූ හෙයින් මහජනයා විසින් රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් තොරතුරු ඉල්ලීමක් කර තිබූ බවට සඳහනක් නොමැත.
05	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	විගණනයේ පෙන්වාදීම්වලින් පසුව වෙබ් අඩවියක් සකස් කිරීමේ කාර්යයේ මූලික අවධියේ කටයුතු කෙරෙමින් පැවැති අතර රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරයන් කැබිනට් අමාත්‍යාංශයට පැවරීමත් සමඟ වෙබ් අඩවියක අවශ්‍යතාවය නොමැති නිසා එම කාර්යය අත්හරින ලදී.

06	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළිපැයෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පැවති මානව සම්පත් ඌනතාවය හේතු කොටගෙන පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වීමක් සිදු වී ඇත.
07	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මානව සම්පත් හිඟය නිසා කොරෝනා වසංගතය හේතුවෙන් සංචරණ සීමා පැවතීම මත සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දුන් පුහුණු අවස්ථා සීමා විය.

කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර
ලේකම්
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, වෛත්‍ය පාර, කොළඹ 01.